# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1990 අංක 7 දරන පාරිභෝගික ණය (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1990 මාර්තු මස 06 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1990 මාර්තු මස 09 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැක

මිල: ශත 45 යි. තැපැල් ගාස්තුව: රු. 1.00 යි.

# 1990 අංක 7 දරන පාරිභෝගික ණය (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1990 මාර්තු මස 6 වන දින]

එල්. ඩී.—ඕ. 63/89

1982 අංක 29 දරන පාරිභෝගික ණය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 1990 අංක 7 දරන පාරිභෝගික ණය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

**2.** (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1982 අංක 29 දරන පාරිභෝගික ණය පනතේ 15 වන වගන්තියෙහි (2) වන උපවගන්තියේ "වරදකරු කරනු ලැබූ විට" යන වචන වෙනුවට "මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට" යන වචන ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය, මෙයින් සංශෝධනය කරනු ලැබේ. — 1982 අංක 29 දරන පනතේ 15 වන වගන්තිය සංශෝධනය කිරීම.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තියෙහි "වරදකරු වියයුතු අතර" යන වචන වෙනුවට "වරදකරු විය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට" යන වචන ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. — ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය සංශෝධනය කිරීම.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තියේ (3) වන උපවගන්තියෙහි "රුපියල් දෙසීයය දක්වා ව්‍යාප්ත විය හැකි දඩයකින් අයිතිකරුට දඬුවම් කරනු ලැබිය යුතු ය." යන වචන වෙනුවට "අයිතිකරු වරදකට වරදකරු විය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් දෙසීයක් නොඉක්මවන දඩයකට අයිතිකරු යටත් විය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. — ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය සංශෝධනය කිරීම.

**5.** 29 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එම වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියේ 29අ වගන්තිය ලෙස බලපැවැත් විය යුතු ය:— — 29අ අලුත් වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කිරීම.

"පුද්ගල මණ්ඩල විසින් කරනු ලබන වැරදි.

29අ. පුද්ගල මණ්ඩලයක් විසින් මේ පනත යටතේ වරදක් කරනු ලබන අවස්ථාවක—

(අ) එම පුද්ගල මණ්ඩලය, සංස්ථාවක් නම්, ඒ සංස්ථාවේ සෑම අධ්‍යක්ෂවරයකු ම, කළමනාකරුවකු ම හෝ ලේකම්වරයකු ම;

(ආ) එම පුද්ගල මණ්ඩලය ව්‍යාපාරික ආයතනයක් නම්, එම ව්‍යාපාරික ආයතනයේ සෑම හවුල්කරුවකු ම; සහ

(ඇ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාගත නොවූ මණ්ඩලයක් නම්, එම මණ්ඩලයේ සාමාජිකයකු වන සෑම පුද්ගලයකු ම

වරදකට වරදකරු විය යුතු ය:

2—ඩී 007513—6,200 (89/12)

එසේ වුව ද, එම වරද තමාගේ දැනීමක් නො මැතිව සිදු කරන ලද බව හෝ, එම වරද සිදු කිරීම වැළැක්වීමට අවශ්‍ය නිසි අනලස්භාවයෙන් තමා ක්‍රියා කළ බව හෝ එම සංස්ථාවේ අධ්‍යක්ෂවරයා, කළමනාකාරවරයා හෝ ලේකම්වරයා විසින් හෝ එම ව්‍යාපාරික ආයතනයේ හවුල්කරු විසින් හෝ ඔප්පු කරනු ලැබුවහොත්, ඔහු එම වරද සඳහා වරදකරු ලෙස සලකනු නොලැබිය යුතු ය.".

අනනුකූලතාවක් ඇතිවූ විට සිංහල භාෂා පාඨය බලපැවැත් විය යුතු බව.

6. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූල තාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.